Master CD/DVD

# USER GUIDE

www.mymaster.lk

අප ආයතනය විසින් නිෂ්පාදිත පරිගණක පාඨමාලා ඇතුලත් සියලුම CD සහ DVD සංයුක්ත තැටි පරිගණක ආශ්‍රයෙන් පමණක් ධාවනය කළහැකි වේ. එය ඔබගේ පරිගණකය වෙත පිටපත් කිරීමක් හෝ ස්ථාපනය කිරීමක් අවශ්‍ය නොවන අතර CD හෝ DVD ධාවකය තුළම ධාවනය කිරීමේ හැකියාව ඇත.

## සංයුක්ත තැටිය භාවිතා කළයුතු පිළිවෙල

**01.** පළමුවෙන්ම සංයුක්ත තැටිය ඔබගේ පරිගණකයට සම්බන්ධව ඇති CD / DVD Rom එක තුලට ඇතුල් කරන්න.

**02.** දැන් CD / DVD එක ඔබගේ පරිගණකය ඔස්සේ ස්වයංක්‍රීයව ධාවනය වනු ඇත.

**03.** ඔබගේ පරිගණක තිරයේ ඔබට මේ ආකාරයේ Massage Box එකක් (පණිවිඩ තිරයක්) ලැබුනොත්, මවුසය භාවිතාකර මෙම ස්ථානය තෝරා ගන්න.




**04.** ස්වයංක්‍රීයව ධාවනය නොවුනහොත්, Computer තුලින් CD / DVD එක තුලට ගොස් එහි ඇති Master.exe file එක ධාවනය කරන්න.

**05.** ඔබට පහත ආකාරයේ Massage Box එකක් (පණිවිඩ තිරයක්) ලැබුනහොත් රැඳීසිටින්න. නැතහොත් මවුසය භාවිතාකර, පහත ස්ථානය තෝරා ගන්න.




**06.** දැන් ඔබගේ සංයුක්ත තැටිය ධාවනය වී, පාඨමාලා හැඳින්වීම ඔබට දිස්වනවා ඇත.
(මෙය නැරඹීමට අවශ්‍ය නොවන්නේ නම්, මවුසය භාවිතාකර එහි ඇති **SKIP** බොත්තම මත Click කරන්න)

**07.** ඉන් පසුව **Menu** තිරය වෙත පිවිසෙනවා ඇත. **Menu** එක තුලදී පාඨමාලාවට ඇතුලත් සියලුම ප්‍රධාන මාතෘකා දැකගැනීමට පුලුවනි. ඉන් මාතෘකාවක් මත Click කළ පසු ඊට අදාල උප මාතෘකා දිස්වන ආකාරය ඔබට දැකගැනීමට පුලුවනි.

**08.** උප මාතෘකාවක් තොරා එය මත Click කළ පසු ඊට අදාල පාඩම ධාවනය වනවා දැකගැනීමට පුලුවනි.

**09.** එක් පාඩමක් අවසන් වූ පසු තිරයේ පහත ඇති **NEXT Lesson** යන Button එක තෝරාගැනීම මගින් ඔබ සිටින ප්‍රධාන මාතෘකාව යටතේ ඇති ඊළඟ පාඩම නැරඹීමේ හැකියාව ඇත. **PREV Lesson** යන Button එක ඔස්සේ ඔබ සිටින ප්‍රධාන මාතෘකාව යටතේ ඇති පෙර පාඩම තෝරා නැරඹීමට හැකියාව ඇත. **MENU** Button එක ඔස්සේ නැවත ප්‍රධාන මෙනුව වෙත ගමන් කිරීමට පුළුවනි.

**10.** මේ ආකාරයෙන් සංයුක්ත තැටියේ ඇති සියලුම පාඩම් පිළිවෙලින් අධ්‍යයනය කරන්න.

**11.** ඔබ විසින් කිසියම් පාඩමක් අධ්‍යයනය කිරීමේදී එම පාඩමට අදාලව පහළ ප්‍රදේශයේ **Play** සහ **Pause** Buttons සහ **Seek Bar** එකක් දැකිය හැකියි. මෙම Controls භාවිතා කර ඔබ නරඹන පාඩම තාවකාලිකව නවත්වා ගැනීම, නැවත Play කර ගැනීම සහ පාඩමේ අවශ්‍ය ස්ථානයකට පහසුවෙන් ගමන් කිරීමේ හැකියාව ඇත.



**Pause** - ධාවනය වන පාඩම තාවකාලිකව නැවැත්වීම සඳහා.

**Play** - පාඩම නැවත ධාවනය කිරීම සඳහා.



මෙහි ඇති මෙම කුඩා සලකුණු මත Mouse Curser එක තබා, Click කරගෙන වමට සහ දකුණට ගෙනයාම මගින් පාඩමේ විවිධ ස්ථාන වෙත ගමන් කිරීමේ හැකියාව ඇත. අනතුරුව **Play** Button එක මත Click කරන්න. එහිදී ඔබ විසින් තෝරාගත් ස්ථානයේ සිට පාඩම ධාවනය කරගත හැක.

**12.** පාඩමක් නරඹන අවස්ථාවේදී ප්‍රායෝගික ක්‍රියාකාරකම් වල නිරතවීම.

ඔබ විසින් කිසියම් පාඩමක් නරඹන අවස්ථාවේදීම එම පාඩමට අදාලව ක්‍රියාකාරකම් වල නිරතවීමේ හැකියාවද ඇත.

මේ සඳහා පළමුවෙන්ම **Pause** Button එක භාවිතාකර පාඩම ධාවනය වීම තාවකාලිකව නවත්වාගන්න. අනතුරුව තිරයේ දකුණු ඉහළ කෙලවරේ ඇති **Minimize** Button එක මත Click කරන්න.



එවිට අධ්‍යපනික වැඩසටහන Minimize වන ආකාරය ඔබට දැකගන්නට පුලුවන්. දැන් ඔබට පාඩමෙහි ඉගෙනගත් කොටස් පාඨමාලාවට අදාල මෘදුකාංගය තුල අත්හදා බැලීමේ හැකියාව ඇත.

නැවත අධ්‍යපනික වැඩසටහන වෙත ගමන්කල යුතු නම් Task Bar එකෙහි පහත දක්වා ඇති සලකුණ සහිත ස්ථානය මත Click කරන්න.



**13.** අධ්‍යපනික වැඩසටහනෙන් සම්පූර්ණයෙන් ඉවත් වීමට අවශ්‍ය නම් තිරයේ දකුණු ඉහල කෙලවරේ ඇති **Close** Button එක මත Click කරන්න. අධ්‍යපනික වැඩසටහනෙන් සම්පූර්ණයෙන් ඉවත් වූ පසුව සංයුක්ත තැටිය ඉවතට ගන්න.

